# ශ්‍රී ලංකාවේ බෞද්ධ දහම් පාසල් අධ්‍යාපනය හා ඉතිහාසය

(එක්දහස් නවසිය අසූවට පෙර යුගය ඇසුරෙන් කෙරෙන විමසුමක්)

- ගාල්ලේ ධම්මින්ද හිමි

පුද්ගල චරිත සංවර්ධනයෙහිලා අත්‍යුදාර සමාජ මෙහෙවරක් සිදුකරන නන්වැදෑරුම් ආයතන අතුරින් දහම් පාසැලට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. සදාචාර මාවතකට අවැසි මර්ගෝපදේශ, දරුවා ලබා ගන්නේ පන්සලෙනි. පන්සල මූලික කරගෙන දහම් පාසල ක්‍රියාත්මක වන අතර, සිංහල බෞද්ධ දේශයට අවශ්‍ය ගුණාත්මක එළඹුම්ද එමඟින් සම්ප්‍රේෂණය කෙරේ. නූතනය වන විට දහම් අධ්‍යාපනය ඉතා පුළුල් පරාසයක සිට කටයුතු කරන්නේ යැයි පැවසුවහොත් එය මුසාවක් නොවනු ඇත. මෙම පුළුල් පරාසය දක්වා පැමිණි ගමන, ඉතිහාසය තුළ සටහන් වූයේ කෙබඳුදැයි අධ්‍යයනය කිරීම මෙම ලිපියේ මූලික අරමුණයි. මෙහිදී අප ඉතිහාසය ලෙස අවධාරණය කරනු ලබන්නේ දහම් පාසැල් ආරම්භක අවධියේ සිට 1980 දක්වා වූ කාල පරිච්ඡේදය තෙක් අදළ කරගත හැකි දත්තවල පරිමාවටය. ඉතිහාසය තොරතුරු, සාධක, දත්ත හා වාර්තාවලින් පිරුණු පරිමිත රචනාවක් බඳුය. එනිසා ඓතිහාසික විමසුමක සිට වර්තමානය දෙස අවලෝකනය කිරීම අප සතු තවත් එක් අරමුණකි.

ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනයට ඉතා දිගු ඉතිහාසයක් පවති. මුල් කාලයේ දී දහම් පාසල් ලෙස නොව 'ඉරුදින පාසල්' ලෙස හැඳින්විණි. ඉරුදින පාසල් බිහිවන්නේ මිෂනාරි අධ්‍යාපනයට ප්‍රතිවිකල්පයක් වශයෙනි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය මගින් මෙරට සාම්ප්‍රදයික අධ්‍යාපනය හමාර කොට ඔවුන්ගේ ප්‍රතිපත්තිවලට අනුව ගමන් කරන අධ්‍යාපන ක්‍රමවේදයක් නිර්මාණය කරන ලදි. මෙම යුගයේ දී පල්ලිය මූලික කරගත් අධ්‍යාපන ක්‍රමයක් ගැන අවධානය යොමු කළ ඔවුහු;

1. 1805 දී ලන්ඩන් මිෂනාරීන්
2. 1812 දී බැප්ටිස්ට් මිෂනාරීන්
3. 1814 දී වෙස්ලියන් මිෂනාරීන්
4. 1816 දී ඇමරිකන් මිෂනාරීන්
5. 1818 දී චර්ච් මිෂනාරීන්

යන මිෂනාරි ව්‍යාපාර ඇසුරෙන් ලාංකේය සිංහල බෞද්ධ අධ්‍යාපන දේහයට තුවාල සිදු කළහ. ලංකාව සම්බන්ධයෙන් ඔවුන් අනුගමනය කරනු ලැබුවේ එක්තරා දෙබිඩි පිළිවෙතකි. එක් අන්තයකින් බ්‍රිතාන්‍ය කිරීටයට හිස නමා ආචාර කළ ඔවුහු තවත් විටෙක උඩරට ගිවිසුමේ පස්වන වගන්ති[1] ප්‍රකාර සිංහල බෞද්ධ රාජ්‍යයේ වගකීමටද බැඳී සිටියහ. ඔවුහු පැහැදිලිවම එංගලන්ත සභාව විසින් රාජ්‍ය ආගම ලෙස අදහනු ලබන ක්‍රිස්තු ලබ්ධිය රැකීමටත් ව්‍යාප්ත කිරීමටත් බැඳී සිටියහ. ඒ වෙනුවෙන්ම අධ්‍යාපන ක්‍රමය සංස්කරණය කළ සුදුපාලකවරු සාම්ප්‍රදායිකව හා ඓතිහාසිකව උරුම වූ බෞද්ධ අධ්‍යාපනය සියතට ගත්හ[2]. ඔවුහු මෙරට සාම්ප්‍රදායික බෞද්ධ අධ්‍යාපනය කිසි ලෙසකවත් මායිම් නොකළහ. එසේ වුවත් වක්‍රාකාරව නිදහස් ආගමික පරිසරයක් මවා පාන්නට උත්සාහ කළහ[3].

බ්‍රිතාන්‍ය රාජ්‍ය පාලනය ලක් පොළොවේ ආරම්භ වූ නොබෝ කලකින්ම එයට පෙර ආගමික හා අධ්‍යාපනික ආයතන කෙරෙහි ලන්දේසි පාලකයන්ගේ යම් බලපෑමක් පැවතුණේ නම් ඒ සියල්ල අභාවයට පත්විය. රටේ ප්‍රධාන ආගම කෙරෙහි බ්‍රිතාන්‍ය පාලකයන්ගෙන් ඇති වූ බලපෑම රටේ ආගමික හා දේශපාලනික තත්ත්ව කෙරෙහි වැදගත් සහනයක් ඉසිලිය. අවුරුදු දෙදහසක සිට බුද්ධාගම මේ රටේ ජනතාවගේ ජීවිත කෙරෙහි මැනවින් පැලපදියන් වී තිබුණි. පුද්ගලයන් විෂයෙහි හා මුළු ජන සමාජයෙහිම මෙම ආගමික හැඟීම් හා වැඳී ජන ජීවිතයේ සෑම අංශයකදීම බෞද්ධ ලක්ෂණ කැපී පෙනෙන්නට විය. විශේෂයෙන්ම රටේ අධ්‍යාපන ක්‍රමය ප්‍රභාවිත වූයේ රටේ ආගමික හැඟීම්වලිනි.[4] මෙවැනි වාතාවරණයක සිංහල බෞද්ධ පෘෂ්ඨවංශිකයෝ පෙරටම ආහ. ඔවුහු ක්‍රිස්තු ලබ්ධිකයන්ගේ මිෂනාරි ව්‍යාපාරයට ප්‍රතිවිරුද්ධ බෞද්ධාගමික



ප්‍රබෝධයක් රට පුරා ආරම්භ කළහ. සර් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් ප්‍රධාන කරගත් පරම විඥනාර්ථ සමාගම (පසුව කොළඹ පරම විඥනාර්ථ සමාගම) මෙහිදී විශාල කාර්යභාරයක් ඉටු කළ බවට සාක්ෂ්‍ය කොතෙකුත් ඇත. මුල්කාලයේ කොළඹ නගරය මුල් කරගත් දහම් අධ්‍යාපන ව්‍යාප්තිය පසුව රට පුරාම ශීඝ්‍රයෙන් විකාශනය වන්නට විය. කොළඹ නගරයේ පමණක් මුල් වකවානුව ඇතුළත ඉරුදින පාසල් 09 ක් ආරම්භ කර තිබුණි. විශේෂයෙන්ම කොටහේන, බොරැල්ල, මරදාන, බාබර් වීදිය, මැසෙන්ජර් වීදිය, කොම්පඤ්ඤ වීදිය, පැලියගොඩ, පංචිකාවත්ත වැනි කොළඹ නගරයේ ප්‍රදේශ කිහිපයකම ඉරුදින පාසල් ව්‍යාපෘතිය සාර්ථකව වී තිබුණි. පුනර්ජීවන ව්‍යාපාරයේ අතිශය කැපී පෙනෙන කාර්යභාරයක් සිදු කළ බෞද්ධ සංවිධානයකි 'මහා බෝධි සමාගම'. මහා බෝධි සමාගම ඉරුදින පාසල් ආරම්භ කළ බවට සාධක හමු නොවුණත් බෞද්ධ පාසල් රාශියක් ආරම්භ කළ බවට සාධක එමටය.[5] ජාතික ව්‍යාපාරයේ සිංහල ලකුණ පරාමර්ශනය කළ 'සිංහල බෞද්ධයා' පුවත්පත එද එය වාර්තා කළේ මෙසේය.

"ගමක් ගමක් පාසාම පාඨශාලා පිහිටුවා බුද්ධ ධර්මය සහිත ශිල්ප ශාස්ත්‍රය ඉගැන්වීම කට යුතුය. බාලයන් පස් පව්, දශ අකුසල් ආදියෙන් දුරුව මනා ගුණ ධර්මයෙහි පිහිටුවීමෙන් රටේත් ජාතියේත් ආගමේත් දියුණුව ගැන වැඩකිරීමට ඔවුන් යෙදීම පහසු වේ."[6] ඒ අනුව පැහැදිලි වන්නේ සිංහලයන්ගේ ධර්ම ඥනය වර්ධනය කිරීමේ යුග අවශ්‍යතාවකින් සමාජයත්, රටත් පෙළී තිබුණ බවයි. 1907 දී සිංහල බෞද්ධයා උත්ප්‍රේරණය කරන උක්ත කරුණ 1911 වන විට සාධනය වී තිබූ බව පැහැදිලිය.[7] ධර්මපාලතුමන් ප්‍රමුඛව ඇරඹි ජාතික පුනර්ජීවන ව්‍යාපාරයේ මුල් අවධියේ බොහෝ කාර්යයන් දකුණු පළාත ආශ්‍රය කරගෙන රට මැදට ව්‍යාප්ත විණි. විශේෂයෙන්ම දහම් පාසල් සත්කාරයේ ආරම්භය පවා දකුණු ලක ඇසුරු කරගනිමින් ව්‍යාප්ත වූ බවක් දක්නට ලැබුණි. ඒ අනුව ඇරඹි, ගාල්ලේ ශෛලබිම්බාරාම විජයානන්ද දහම් පාසල ආරම්භක දහම් පාසැල්වලින් මුල් ගණයට අදළ වන බව සැලකේ.[8] එනිසාම

විජයානන්ද දහම් පාසැල ලංකාවේ මුල්ම දහම් පාසල ලෙස ඇතැම්හු සලකති.

## ශ්‍රී ලංකාවේ බෞද්ධ දහම් පාසල් අධ්‍යාපනය හා තදනුබද්ධ ක්‍රියාකාරී සංවිධාන

ශ්‍රී ලාංකේය දහම් පාසල් ඉතිහාසය පිරික්සන විට එහි උන්නතිය වෙනුවෙන් ක්‍රියාකාරීව කටයුතු කළ සහ කරන ආයතන හතරක් හඳුනාගත හැකිය.

- පරම විඥනාර්ථ සමාගම (පසුව කොළඹ පරම විඥනාර්ථ සමාගම)
- කොළඹ තරුණ බෞද්ධ සංගමය (1948-1970 දක්වා දහම් පාසැල් පරිපාලන කටයුතු භාරව කටයුතු කරන ලදි)
- බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව හා කොළඹ තරුණ බෞද්ධ සංගමය (1981 සිට මේ දක්වා)

1919 වර්ෂය ශ්‍රී ලාංකේය දහම් අධ්‍යාපනයට සුවිශේෂී වසරකි. එම වර්ෂයේ කොළඹ ආනන්ද විද්‍යාලයට එක් රැස් වන බෞද්ධ සම්මේලන නියෝජිතවරු, වාර්ෂිකව දහම් පාසල්වල ධර්ම පරීක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීමට ඒකමතිකව තීරණය කළහ.[9] එය මෙරට දහම් අධ්‍යාපනයෙහි උන්නතිය විෂයෙහි ගනු ලැබූ වටිනා තීරණයකි. මෙම උත්සව සභාවේ මූලාසනය කොළඹ තරුණ බෞද්ධ සංගමයේ ආරම්භක සභාපති සර් ඩී.බී ජයතිලක මහතාට හිමිවිය.[10] කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් පළමුවරට 1920 වර්ෂයේදී ධර්ම පරීක්ෂණය (එකල බෞද්ධ ශිෂ්‍ය විභාගය ලෙස හැඳින්විණි) පැවැත්වූ අතර ඒ සඳහා පාසල් 27කින් සිසුන් 374ක් ඉදිරිපත් වූ බැවින් 228ක් සාමාර්ථ්‍ය ලැබූ බවත් සඳහන්ය.[11] විවිධ බාධක මධ්‍යයේ පවත්වාගෙන ගිය විභාග කටයුතු සිසුන්ගෙන් අයකිරීමකින් තොරව පවත්වාගෙන යාමට තරම් සංගමය කාරුණික වී ඇති බව සඳහන් කළ යුතුය.



### ධර්ම පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ පාසල් සංඛ්‍යාව සහ සිසුන් සංඛ්‍යාව[12]

| වර්ෂය | පාසැල් ගණන | වර්ධනය | විභාගාපේක්ෂක සංඛ්‍යාව | එක් පාසැල කට හිමිවූ සාමාන්‍ය ගණන |
|---|---|---|---|---|
| 1920 | 27 | - | 374 | 13.85 |
| 1924 | 28 | 3.7 | 1532 | 54.71 |
| 1928 | 75 | 16.78 | 4570 | 60.93 |
| 1932 | 146 | 98.66 | 9358 | 62.8 |
| 1936 | 239 | 60.4 | 11591 | 44.49 |
| 1940 | 463 | 93.72 | 22091 | 47.71 |
| 1944 | 452 | 2.37 | 15694 | 34.72 |
| 1948 | 637 | 40.92 | 37288 | 58.58 |

උක්ත සටහන දෙස බලන ඕනෑම අයෙකුට වුව පැහැදිලි වන සත්‍ය නම්, දහම් අධ්‍යාපනය සඳහා යොමු වී ඇති ප්‍රවණතාවේ අගය ඉහළ මට්ටමකට වර්ධනය වී ඇති බවයි. තවද මෙහි පැනෙන සාක්ෂ්‍යයක් වන්නේ සමකාලීක සමාජ, ආර්ථික හා දේශපාලනික සංසිද්ධීන් හා සමගාමීව අධ්‍යාපනයද ඉදිරියට ගමන් කර ඇති බවයි. 1940-44 වන විට මෙරට දහම් අධ්‍යාපනයේ දෘශ්‍යමාන පරිහානියක් සිදුව ඇති බව ඉහත දත්තවලින් වගුවේ ප්‍රකාශිතය. සමකාලීනව 1942 අප්‍රේල් 05 වැනිදා ජපනුන් විසින් කොළඹට බෝම්බ හෙළීම[13] වැනි පෘථුල සිද්ධියකට පසු එළැඹි ආර්ථික, සාමාජික කඩා වැටීම දහම් අධ්‍යාපනයේ කඩාවැටීමටද බලපාන්නට ඇති බව අනුමාන කළ හැකිය. තව දුරටත් පැහැදිලි කරනවා නම් 1948 වන විට මෙම

තත්ත්වය මග හැරී දහම් අධ්‍යාපනය කෙරෙහි සමාජ නැඹුරුවේ ඉහළ මට්ටමක් දක්නට ලැබෙන්නේ, 1943 නොවැම්බර් ඉදිරිපත් කරන ලද අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභාවේ වාර්තාව (කන්නන්ගර වාර්තාව) මගින් නිදහස් අධ්‍යාපනයට පදනම දැමීමත් සහ එමගින් ආගම ඉගැන්වීම අනිවාර්ය කිරීමත්[14] යනාදී කාරණා පදනම් කරගෙනය.

1948 වන විට මෙරට බෞද්ධ සංගම් තම කාර්ය සාඵල්‍ය ඉතා ඉහළ මට්ටමක රැගෙන ආවේ ක්‍රමවත් පිළිවෙළකට ඔවුන් විසින් දියත් කළ වැඩපිළිවෙළ නිසාවෙනි. 1927 වැනි දුරාතීතයකදී පවා ඔවුන් තම සාර්ථකත්වය යම් ප්‍රමාණයකට ළඟා කරගෙන තිබුණි.[15] මෙම සාර්ථකත්වය පිළිබඳ වැඩි යමක් එකල බෞද්ධයා පත්‍රයේ පළ වූයේ මෙලෙසිනි.

"රටේ ආගමික අධ්‍යාපනය විධිමත් කිරීම සඳහා අප සංගමය මගින් පවත්වන ධර්ම පරීක්ෂණ ආරම්භ කළේ මෙයට අවුරුදු සතකට උඩදීය. ඒ ආරම්භ කිරීමේ දී බෞද්ධ මහජනතාවගෙන් එයට ලැබෙන සහයෝගය පිළිබඳ දැඩි විශ්වාසයක් අපට තිබුණේය. එකල අප ඇති කොටගත් විශ්වාසය පදනම් රහිත එකක් නොවන බව දැනට නිකුත් වී ඇති ධර්ම පරීක්ෂණ පිළිබඳ ප්‍රතිඵලවලින් වටහාගත හැකිය. අප විසින් සංවිධානය කොටගත් විධිමත් ආගමික අධ්‍යාපන ක්‍රමය හේතුකොට ගෙන දැනට රටේ විවිධ පෙදෙස්වල දහම් පාසැල් පිහිටු වීම ආරම්භ වී තිබේ. අලුතෙන් ලියාපදිංචි කරවීම වැඩි වන බව අපි කලින් දැන සිටියෙමු. බෞද්ධ ධර්මය හදුරා ඒ අනුව සක්‍රීය ජීවිත හැඩ වැඩ ගසාගත් බෞද්ධ පරපුරක් නුදුරු අනාගතයේදී අපට දැකගත හැකිවනු නොඅනුමානය.[16] ඔවුන් අපේක්ෂා කළ මෙම සාර්ථකත්වය 1948 දී එනම් වසර 20කට පසුව ළඟා කරගෙන ඇති බව සංඛ්‍යා දත්ත පිරික්සීමේදී පැහැදිලිය. 1948 වන විට මෙරට දහම් අධ්‍යාපනයේ වර්ධන අගය 40.92 කි. එය 1932 වර්ෂයේ තරම් ඉහළ මට්ටමක නොවූවත් සැලකිය යුතු මට්ටමක් බව අප පෞද්ගලික මතයයි. 1948 යනු මහා බ්‍රිතාන්‍යයෙන් අප නිදහස ලැබූ යුගයයි. එය එක්තරා ආකාරයකට සංක්‍රාන්ති සමයකි. මේ වන විට දිවයිනේ



ලියාපදිංචි දහම් පාසැල් 1750 කට අධික සංඛ්‍යාවක් පැවති බවට කොළඹ තරුණ බෞද්ධ සංගමයේ සංඛ්‍යා දත්ත වාර්තා කරයි.[17]

දහම් අධ්‍යාපනයේ සංවර්ධනය උදෙසා 1956 සිට සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව කටයුතු කළේය.[18] 1957 වර්ෂය වන විට එම දෙපාර්තමේන්තුව මඟින් ලංකාවේ දහම් පාසල්වලට වගකියන ආයතනයක් පිහිටුවන ලබයි. එනම් දහම් පරීක්ෂණ සභාව නම් වූවකි. දහම් පරීක්ෂණ සභාවේ බලතල හා කාර්ය විධි පහත පරිදි විය.

1. දැනට දහම් පාසල් නැති පාසල්වල ඒවා පිහිටුවන පිළිවෙළ සොයා බැලීම
2. දහම් පාසල් මනාව සංවිධානය කළ යුතු ආකාරය
3. දහම් පාසල්වල භාවිත කරන පොත් සකස් වියයුතු නම් එය සකස් විය යුත්තේ කෙසේද?
4. දහම් පාසල් පැවැත්වීමට බලවත් බාධකයක් වී තිබෙන ගුරුවරුන්ගේ අඩුව පිරිමසා ගත හැකි ආකාරය
5. බෞද්ධ ශිෂ්‍ය විභාගය හා බෞද්ධාචාර්ය විභාගය දැනට වඩා ක්‍රමවත් බවට හා වැදගත් බවට පත් කළ යුතු ආකාරය කෙසේද?
6. දහම් පාසල් සඳහා රජයේ ආධාර දිය යුතු පිළිවෙළ
7. යට සඳහන් කරුණු හා බෞද්ධ දරුවන්ගේ ධර්ම ඥානය හා සදාචාරය දියුණු කිරීම සඳහා වෙනත් අවශ්‍ය කරුණු[19]

එම සභාව දක්වන ආකාරයට 1958 වන විට මෙරට 5000 වඩා ප්‍රමාණයක් දහම් පාසල් තිබුණි.[20]

දහම් පාසල් ධර්ම පරීක්ෂණ බෞද්ධ ශිෂ්‍ය විභාගය

විභාගාපේක්ෂක සංඛ්‍යාව හා විභාග ප්‍රතිඵල 1920-48[21]

| වර්ෂය | විභාගාපේක්ෂක සංඛ්‍යාව | වර්ධනය | සමස්ත ගණන | ප්‍රතිශතය | වර්ධනය |
|---|---|---|---|---|---|
| 1920 | 374 | - | 228 | 60.96 | - |
| 1924 | 1532 | 307.62 | 668 | 43.6 | 192.98 |
| 1928 | 4570 | 198.3 | 1906 | 41.7 | 185.32 |
| 1932 | 9358 | 104.77 | 3389 | 36.21 | 77.8 |
| 1936 | 11591 | 23.86 | 8670 | 74.79 | 155.82 |
| 1940 | 22091 | 90.58 | 10450 | 47.3 | 20.53 |
| 1944 | 15694 | -28.95 | 5066 | 32.27 | -51.52 |
| 1948 | 37288 | 137.59 | 14931 | 40.04 | 194.72 |

උක්ත වගුවට අනුව, එක් එක් කාලවල දී අවපාතයක් පෙන්නුම් කළත්, 1948 වන විට දහම් අධ්‍යාපනයේ ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කළ බව පැහැදිලිය. මෙම ධර්ම පරීක්ෂණ මුල් වරට ආරම්භ කරන ලද්දේ කොළඹ තරුණ බෞද්ධ සංගමයේ ධර්ම පරීක්ෂණ අංශය මගිනි[22]. ඔවුන් ඉතා විධිමත් පිළිවෙළකට අනුව තම කාර්ය ඉදිරියට කරගෙන ගොස් ඇති බව මේවායෙහි වර්ධනීය ලක්ෂණ දෙස විචාරාක්ෂියෙන් බලන්නෙකුට පැහැදිලි වේ.



තම කාර්ය සාඵල්‍යයේ පියවර කිහිපයක් ඉදිරියට යන කොළඹ තරුණ බෞද්ධ සංගමය බෞද්ධ ධර්මාචාර්ය විභාගය වාර්ෂිකව පැවැත්වීමේ උතුම් කාර්යට අතහිත දේ.[23] "කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් අවුරුදු පතා පවත්වන ලබන බෞද්ධ ශිෂ්‍ය විභාගය නිසා බෞද්ධ පාඨශාලීය ශිෂ්‍යයන් අතර ආගම ධර්මය ඉගෙනීම අවුරුදු පතා දියුණු වී ගෙන යන්නේය. එම දියුණුතාව තහවුරු කිරීම සහ වැඩීම පිණිසත් ඉගැන්වීමෙහි නියුක්ත වී සිටින ආචාර්යවරුන්ගේ ආගම දැනීමේ හා ඉගැන්වීමෙ ශක්තිය වර්ධනය කිරීම සඳහාත් සේදවත්තේ වලව්වේ විජයවර්ධන ළමාතැනිගේ ඉල්ලීම ලෙස අප සංගමය විසින් බෞද්ධාචාර්ය විභාගයක්ද අවුරුදු පතා පැවැත්වීමට තියම කරගෙන තිබේ."[24]

බෞද්ධාචාර්ය විභාගය විභාගාපේක්ෂක සංඛ්‍යාව හා ප්‍රතිඵල 1926-48[25]

| වර්ෂය | විභාගාපේක්ෂක සංඛ්‍යාව | වර්ධනය | සමත් ගණන | ප්‍රතිශතය | වර්ධනය |
|---|---|---|---|---|---|
| 1926 | 12 | - | 09 | 75 | - |
| 1930 | 16 | 33.33 | 07 | 43.75 | -22.22 |
| 1934 | 24 | 50 | 12 | 50 | 71.74 |
| 1938 | 50 | 108.33 | 35 | 70 | 191.66 |
| 1942 | 59 | 18 | 37 | 62.71 | 5.71 |
| 1946 | 35 | -40.67 | 19 | 54.28 | -48.64 |
| 1948 | 161 | 360 | 42 | 26.08 | 121.05 |

1948 වන විට බෞද්ධ ධර්මාචාර්ය සමතුන්ගේ සංඛ්‍යාව 42 දක්වා වර්ධනය වී ඇති බවත් එය මෙහි සාධනීය ලක්ෂණයක් ලෙසත් අගය කළ හැකිය. මෙම ඉක්මන් සංවර්ධනයට විවිධ හේතු සාධක බලපා ඇත. පෙර සඳහන් කළ ධර්ම පරීක්ෂණ සභා පිහිටුවීම, පශ්චාත් කාලීන දහම් අධ්‍යාපනයේ ව්‍යාප්තියටත් විභාග කටයුතුවල නිරවද්‍යභාවයටත් ඍජුව බලපා තිබේ. එමගින් දහම් අධ්‍යාපනයේ උන්නතිය උදෙසා ඉතා වටිනා යෝජනා කිහිපයක්ම ඉදිරිපත් කෙරිණි.

1. දහම් පාසල් පාර්ලිමේන්තුවේ සම්මත පනතකින් රජය පිළිගත් සංවිධානයක් කළ යුතුය
2. දහම් පාසල් සංවිධානය සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් පිහිටුවා ගනු ලබන ප්‍රාදේශික ශාසනාරක්ෂක බල මණ්ඩල මඟින් කළ යුතුය
3. ශිෂ්‍යයන්ගේ වයස් මට්ටම්, මානසික තත්ත්වය, ශබ්දකෝෂය හා ප්‍රතිභා ශක්තියට අනුව පන්ති, පොත් හා විභාග නිර්දේශ මාලා සකස් කළ යුතුය
4. දහම් පාසල් මණ්ඩලය මගින් පවත්වනු ලබන ධර්ම පරීක්ෂණ පිළිබඳ ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීමට හා උත්තර පත්‍ර බැලීමටද දහම් පාසල් මණ්ඩලයේ උපදෙස් පරිදි සංස්කෘතික අධ්‍යක්ෂ විසින් විශේෂ මණ්ඩලයක් පත් කළ යුතුය
5. සියලුම බෞද්ධ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බුද්ධ ධර්මය අනිවාර්ය විෂයයක් ලෙස ඉගැන්වීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් සුදුසු විධි විධාන යෙදිය යුතුය
6. රජය දහම් පාසල් සඳහා මුදලින් දෙනු ලබන ආධාර දහම් පාසැල් මණ්ඩලයට භාර දිය යුතුය. දහම් පාසල්වල දියුණුව අනුව මේ මුදල වර්ෂයක් පාසා වැඩි කළ යුතුය
7. ළමයින්ගේ චරිත හැඩගැස්වීමේ ක්‍රමයක් ඇති කළ යුතුය[26].

මෙම යෝජනාවල සාධනීය, දුසාධනීය ලක්ෂණ පිළිබඳ ඉඟියක් ඉදිරි වර්ෂ 20ක් පමණ වන විට දක්නට ලැබුණි. 1970-81



දක්වා වූ කාලයේද ලාංකේය දහම් පාසැල් ක්‍රමයෙහි විවිධ වෙනස්කම් සිදුව තිබුණි. විශේෂයෙන්ම දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය හා ධර්මාචාර්ය විභාගය පිළිබඳ කෙටුම්පත් සකස් වන්නේ මෙම කාල වකවානුවේදීය.[27] 1981 වන විට ශ්‍රේණි විභාග[28] නමින් ඇගයීම් ක්‍රමයක්ද හඳුන්වා දෙන අතර එමගින් වාර්ෂික දහම් අධ්‍යාපනයට දරුවා දක්වන කුසලතාව පිළිබඳ නිගමනවලට එළඹීමට හැකියාව ලැබුණි.

දහම් පාසල් අධ්‍යාපනයෙහි අද වන විට දක්නට නොලැබෙන එහෙත් 1970 වර්ෂය වන විටත් පැවති ධම්මපද විභාගයක් පිළිබඳ වාර්තා වේ.[29] මීට ආසන්නව 1964 දී පැවැත් වූ අභිධර්ම පරීක්ෂණය ද සඳහන් කළ හැකිය.[30] ප්‍රාරම්භ මධ්‍යම හා තෘතීය පරීක්ෂණ වශයෙන් කාණ්ඩ තුනකින් පවත්වනු ලැබූ විභාගයකි මෙය. තවද ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලද ධර්ම පරීක්ෂණයක් ගැනද එම වර්තාවල සඳහන්ය. එහිදී ලංකාව හැරුනු විට තායිලන්තය, පිනැංගුව, සිංගප්පූරුව, හා නැගෙනහිර පකිස්තානය යන මධ්‍යස්ථාන කිහිපයක පරීක්ෂණ පවත්වා ඇත[31]. දහම් අධ්‍යාපනය කෙරෙහි පැවති ධර්ම පරීක්ෂණ ඉතා සාධනීය මට්ටමක පැවති අතර විභාග වංචා ප්‍රශ්න පත්‍ර පිටවීම් ආදියෙන් විනිර්මුක්ත විශ්වසනීය පිළිවෙළකට මෙම කාර්යය පවත්වා ඇත.[32]

1959 වන විට සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් ලාංකේය දහම් අධ්‍යාපනයේ ප්‍රගමනය විෂයෙහි ඉතා වැදගත් තීරණයක් ගනු ලැබීය. එනම් විහාරස්ථ ශාසනාරක්ෂක සමිති හා ප්‍රදේශීය මණ්ඩල පිහිටුවීමයි.[33] මෙම බලමණ්ඩල පිහිටුවීමේ පරමාර්ථ ලෙස ඔවුන් දක්වන්නේ;

1. බෞද්ධ ගිහි පැවිදි සම්බන්ධතාව ඇති කිරීම හෝ තහවුරු කිරීම
2. අභිනවයෙන් දහම් පාසැල් පිහිටුවීම
3. දහම් පාසැල් පොත් බෙදා දීම
4. අපරාධ මර්දනය
5. අමද්‍යප කටයුතුවලට ධෛර්යය දීම[34]

යනාදී යෝජනාවන්ය. මෙම තීන්දු තීරණ මෙරට දහම් අධ්‍යාපනයේ උන්නතියට දශමයක හෝ දයකත්වයක් ලබා දී ඇති බව අප විශ්වාසයයි.

## ලාංකේය දහම් අධ්‍යාපනයේ දිශානතිය

මෙම මාතෘකාවට ප්‍රවිශ්ට වීමට ප්‍රථම 1978 සිට 1982 දක්වා වූ කාලයෙහි මෙරට දහම් අධ්‍යාපනයේ වර්ධනය පිළිබඳ කියැවෙන වගුව අධ්‍යයනය කළ යුතුය.

| වර්ෂය | පාසැල් ගණන | වර්ධනය | වර්ධන ප්‍රතිශතය |
|---|---|---|---|
| 1978 | 4112 | - | - |
| 1979 | 4511 | 399 | 9.7 |
| 1980 | 5092 | 581 | 11.4 |
| 1981 | 5315 | 223 | 4.2 |
| 1982 | 5641 | 326 | 5.8 |

කො.ත.බෞ.ස.ධ.ව. වාර්තා ආශ්‍රයෙනි.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙ. වාර්තාව 1982 (අමුද්‍රිත).

මෙහි සංඛ්‍යාත්මකව ඉහළ අගයක් පෙන්නුම් කරන වර්ෂය 1982 වර්ෂයයි. 1978 සිට 1982 දක්වා මෙරට දහම් පාසැල් එකක්වත් නොවැසුණ බව නොපවසා ඒ වෙනුවට නව දහම් පාසල් ශීඝ්‍රයෙන් වර්ධනය වූ බවක් උක්ත වගුව අපට කියාදෙන පාඩමයි. මුලදී කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් දහම් පාසැල් පවත්වාගෙන ගිය අතර පසුව සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවට පවරන ලදී.[35] ඒ අනුව විමධ්‍ය ගත කොට, දිසා ශාසනාරක්ෂක මණ්ඩලය හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලය පිහිටුවීමෙන් ඉනික්බිතිව දහම් පාසල් පරිපාලනයේ නව පිටුවක් පෙරළිණි.



"වැඩිහිටි සමාජය තරුණ පරපුරට කැඩපතක් බඳු විය යුතුය. සදාචාර සංවර්ධන පොඩිත්තන්ට හැඩහුරු වන්නේ සමාජයෙන් බවට හේතු සාධක බොහෝය. ළමාවියේ සිටින්නවුන්ගේ සදාචාරාත්මක පරිසරය නිගමනය වන්නේ වැඩිහිටියන්ගේ බලපෑම මතය. යම්හෙයකින් අප බාලපරපුර සාරධර්මයන්ගෙන් පිරිහීගිය බවක් පෙන්නුම් කරනුයේ නම් එයින් පිළිබිඹු වන්නේ, එම තත්ත්වය ඔවුන්ගේ වැඩිහිටියන්ගෙන් උරුම වූවක් බවය."[36] සදාචාර වර්ධනය එතරම්ම සමාජමය අවශ්‍යතාවකි. දහම් පාසැල් මගින්ද දෙමාපියන් බලාපොරොත්තු වන්නේ සදාචාර මාර්ගයට පිවිසි දරුවෙකි. ඔහුට සමාජයේ දෙපයින් සිටගන්නට නම්, හදවතට යමක් එකතු කරගත යුතුය[37]. මෙම සදාචාර පාඩම ලැබිය යුතුම ස්ථානය පන්සලයි. එය පන්සල වශයෙන්ම අප යෝජනා කරන ලද්දේ, පාසලක පවත්වන දහම් පාසලකට වඩා පන්සලක් අශ්‍රය කරගෙන පවත්වන දහම් පාසලක අත්‍යන්ත සුලක්ෂණ බොහොමයක් පවතින නිසාය. පන්සල ආගමික ශ්‍රද්ධාව දනවන ස්ථානයකි. ළමයාට පොතින් ලබන සදාචාර පිළිබඳ පාඩම, ආගමික පරිසරය පන්සලෙන් නිතැතින්ම ලැබිය හැකිය. 1981 ප්‍රකාශයට පත් වූ දහම් ගුරු අත් පොතේ මේ සඳහා අවශ්‍ය කරන මතිමතාන්දර සඳහන් වන්නේ මෙසේය.

"ගුරුවරයාත් ශිෂ්‍යයාත් අතර ඇතිවිය යුත්තේ සුහදතාව මෙන්ම ගුරු ගෞරවයද රැකගෙන තම ශිෂ්‍යයන් නියම මාර්ගයේ ගමන් කරවීමට හා ඔවුන්ට නිසි ලෙස ධර්මය උගන්වා ඔවුන් ප්‍රතිපත්ති ගරුක, විනය ගරුක, සදාචාර සම්පන්න පිරිසක් කිරීමට නම් ගුරුවරයා ඉතා බුද්ධිමත් කාර්යශූර ගුණ ධර්ම සම්පන්න කෙනෙකු විය යුතුය. මේ සඳහා එම ගුරුවරයාට අධ්‍යාපන ක්‍රම, අධ්‍යාපන මූලධර්ම හා මනෝවිද්‍යාව පිළිබඳ සෑහෙන අවබෝධයක් තිබිය යුතුය. එමෙන්ම සමාජ විද්‍යා පිළිබඳව උසස් දැනුමක් තිබිය යුතුය. එසේ නොවුවහොත් ශිෂ්‍යයාට සාර්ථක අධ්‍යාපනයක් දීමට නොහැකිවනු ඇත."[38] කරුණු මෙසේ වුවත් අද පවා අප මුහුණ දෙන ප්‍රායෝගික ගැටලුව නම්, ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් දහම් අධ්‍යාපනය ලබා දීමට ඉදිරිපත්ව නොවීමයි. එසේ සිටිය නමුත් ඔවුන්ගේ පැමිණීමේ දුර්වලතා

එමටය. එය අඛණ්ඩ සංවර්ධනයක් කරා ගමන් කිරීමට ඇති විශාල බාධාවක් වන්නේය. "දහම් පාසල් ව්‍යාපාරයට අද ඇති ලොකුම බාධකය ගුරු හිඟයයි. සුදුසු ගුරුවරුන් සෑහෙන ප්‍රමාණයක් සපයා ගැනීමට නොහැකි වුවහොත් දහම් පාසලෙන් නියම ඵලය ලබාගැනීමට නොහැකි වන්නේය.[39] මේ දක්වූයේ මීට වසර 50කටත් එහා දුරාතීතයකට අදළ වූවකි. එය අදද එසේම බලපැවැත්වෙන කාරණාවකි. "දහම් පාසැල්වලින් ධර්මය ඉගැන්වීම පමණක් කරන්නේ නම් අප බලාපොරොත්තු වන සේවය ඉටු නොවේ. දැනුම දීම වැදගත්ය. එහෙත් ඊට වඩා වැදගත් වන්නේ බෞද්ධයන් ලෙස ජීවත් වන්නට ළමයින්ට දෙන පුහුණුවයි. පාඨශාලාවේ පරිසරය ගුණදහම් වැඩීමට හිත කර විය යුතුය. එවැනි පරිසරයක් ඇති කළ හැක්කේ ගුරුවරුන්ටය. ගුරුවරයා ආදර්ශවත් බෞද්ධයන් විය යුතුය.[40]

## සමාලෝචනය

කරුණු එසේ හෙයින් දහම් පාසැල නම් මෙම උතුම් ආයතනය, ගුරුවරයා, ශිෂ්‍යයා හා සමාජය යන තුලක අතර මනා සංකලනයකින් සුසැදි සංස්ථාවක් විය යුතුය. එහිදී රජයෙන් ලැබිය හැකි, ලැබිය යුතු නිසි වටිනාකමද දහම් පාසලට හිමිවීම අනිවාර්යය. සදචාරය තේමාව කරගත් දහම් පාසල දරුවාට ජාතික, ආගමික හැඟීම් ලබාදෙන ආයතනයක් ලෙසත් කටයුතු කිරීම යුක්ති යුක්තය. මක්නිසාදයත් මෙරට දහම් අධ්‍යාපනය (දහම් පාසල) ආරම්භ වන්නේම, ජාතික ආගමික චින්තනයට මරු පහරක් එල්ල වූ අවධියකදීය. "සිංහලයන් දුෂ්චරිතයන් අප්‍රිය කළ ජනතාවක්ව සිටියහ. අපරදිගින් ආ ක්‍රිස්තියානි භෞතික ශිෂ්ටාචාරය විසින් සිතාමතාම අප රට වැසියන් බේබද්දන්, හොරුන්, සල්ලාලයන්, බොරුකාරයන්, අපරාධකාරයන් හා මිනීමරුවන් බවට පත් කර ඇත."[41] විවිධ ආක්‍රමණිකයන්ගේ බලපුළුවන්කාරකම්වලට එදා ලක් වූ අප[42] නූතනය වන විට ද විවිධ අත පෙවීම්වලට ලක් නොවූවත් නොවේ. ආක්‍රමණිකයෝ ඉතිහාසය පුරාවටම කළේ මෙරට සමාජ, ආර්ථික, දේශපාලන සන්දර්භය ඔවුන්ගේ පාලනයට නතු කර ගැනීමයි. එමෙන්ම සංස්කෘතික ආක්‍රමණද සිදුකිරීමට ඔවුහු



පසුබට නොවූහ. 1546දී පෘතුගාල රජු ඉන්දියාවේ තම යුව රජුට යැවූ ලිපියක මෙසේ සඳහන්වේ. "කඩිසර නිලධාරීන් ලවා සියලුම ප්‍රතිමාවන් සොයා සුණු විසුණු කර දැමීමටත් නියෝග කරමු. ලෝහ, ලී, මැටි ආදී කවර ද්‍රව්‍යයකින් වුවද කවර ප්‍රතිමාවක් වුවද කරවන, අඹවන හෝ සිතුවම් කරන එසේම පිටරටවලින් ගෙනෙන සියලු දෙනාටද, මහජන ස්ථානවලදී හෝ ගෙදර දොරේදී හෝ එවැනි ප්‍රතිමා ඇතුළත් උත්සව පවත්වන්නාවූ හෝ එයට සම්බන්ධ වන්නාවූ සියලු දෙනාට ඉතා දරුණු දඬුවම් පමුණුවන බව නිවේදනය කිරීමට අපි ඔබට භාර කරමු."[43] ඉන්දියාවට සාපේක්ෂව ශ්‍රී ලංකාවද නිදහස් නිවහල් ස්වෛරී රාජ්‍යයක් වෙනුවෙන් ඉතිහාසයේ අනන්ත, අප්‍රමාණ ජීවිත පූජා කර ඇත. යටත් විජිතකරණය නමැති සංදර්භය අභියස ඉන්දියාවට පමණක් මෙම ප්‍රකාශය අදළ නැත. අසල්වැසි ලංකාවටද එය එලෙසම අදළ වූ බව අප සාක්ෂ්‍ය ඇතිව පෙන්වා දී ඇත. මෙරට දහම් පාසල් අධ්‍යාපනයේ යුග අවශ්‍යතාව මතුව එන්නේ ඉංග්‍රීසි අධ්‍යාපනය මගින් කතෝලික දහම සමාජගත කිරීමට දරන වෑයමක ප්‍රතිඵලයක් වශයෙනි. එහිදී අධ්‍යාපනය පිළිබඳ පූර්ණ වගකීම් දැරුවෝ කතෝලිකයෝම වූහ.[44] එහෙයින් උක්ත කාරණා සම්පිණ්ඩනය කරමින් අප පවසන්නේ ඉතිහාසය තුළ මෙරට දහම් අධ්‍යාපනය යුග අවශ්‍යතාවක් ඉටු කළ බවයි. ඒ සඳහා 1920 පමණ සිට 1980 දක්වා තරම් කාලයකට අදළ සාධක අප විසින් පිරික්සන ලදී. වර්තමානය වන විට මෙරට දහම් පාසැල් අධ්‍යාපනය ලබා ඇති ප්‍රගමනය හෝ අපගමනය පිළිබඳ සාධක ඉදිරිපත් කර නැති අතර ඓතිහාසික සාධක මගින් වර්තමානයට අදළ උපන්‍යාස ගොඩනගා ගැනීමට පුළුවනි. එය විවෘත මනසකින් හැසිරවිය යුතු හා සියුම් ඥනයකින් විමසිය යුතු භාවනාවක් වැනිය.

## ආන්තික සටහන්

1. උඩරට ගිවිසුමේ පස්වන වගන්තියේ සඳහන් වන්නේ මෙලෙසිනි, "මෙකී රටවල්වල මුලැදෑනීන් සහ වැසියන් විසිනුත් අදහන්නාවූ බුද්ධශාසනයද, දේවාගමද කඩකළ නොහැකිව පවත්වන්ඩ ඕනෑවා සහ එකී කටයුතුද, සංඝයාද, විහාරස්ථානද, දේවාලද, පවත්වන්ඩ සහ ආරක්ෂා කරන්ඩත් ඕනෑය".

2. "ප්‍රථමයෙන් ඔබේ අවසරයත් හා අනුමැතියකින් නොලබා කිසිම වර්ගයක පාසලක් ඉහත සඳහන් යටත් විජිතයේ පවත්වාගෙන යාමට කිසිවෙකුටත් ඉඩ නොතැබීම අපගේ බලාපොරොත්තුව හා කැමැත්තය. අධ්‍යාපනය පත්වාගෙන යෑමට අවසර ඉල්ලන පුද්ගලයන්ගේ සදචාරය හා නිසි යෝග්‍යතාවන් කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරමි." විදේශභාර මහලේකම්වරයාගෙන් ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාට 1798 මාර්තු 26 දින එවන ලද උපදෙස. සී. ඕ. 55. 61, 1798; කෝල්බෲත් කැමරන් වාර්තාව, පී. සී මැන්ඩිස් සංස්කරණය, 2වැනි කාණ්ඩය, (ලන්ඩන්:, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 1956) 77 පිටුව.
3. "තවද ලන්ඩනයේ ප්‍රධාන බිෂොප්වරයාගේ ආගමික බලතල අපගේ අලුත්ම යටත් විජිතය වන ලංකාව කෙරෙහි පහසු අයුරකින් වලංගුවන පරිදි කටයුතු වලංගුතා පරිදි කටයුතු සැලකිය යුතුයි. ඉහත කී බිෂොප්වරයාට මෙම කාර්යය ඉටුකිරීමෙහිලා ධෛර්යයක් හා අනුබලයක් ලැබීමට සැලැස්වීම අපගේ කැමැත්ත හා සතුටයි. අපගේ අණ්ඩුකාර වූ ඔබටම සීමා වී තිබෙන පරිත්‍යාග භාර ගැනීම, විවාහ බලපත්‍ර දීම සහ අන්තිම කැමැත්ත සඳහන් ඔප්පු වලංගු කිරීම පමණක් හැර ආගමික නීතිරීති ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය බලතල එකී බිෂොප්වරයාගේ නියෝජිතයන්ට පැවරීම ඔබට භාර කරමි."එම, රාජ්‍ය ලේකම්ගෙන් නෝත්ට,සී. ඕ. 55. 61, 1798.
4. හැවැන්පොළ රතනසාර හිමි, බ්‍රිතාන්‍ය ප්‍රතිපත්ති බුදු සමය හා පිරිවෙන් අධ්‍යාපනය 1815-1965 , (කැලණිය: දීපා මුද්‍රණාලය, 1970) 28 පිටුව.
5. *Objectives and Rules of the Mahabodhi Society of Sri Lanka*, (Colombo :Kularatne and co. Ltd, 1969) P. 439.
6. සිංහල බෞද්ධයා, 1907.09.28, පිටුව 07.
7. "1911වන විට කොළඹ පරම විඥානාර්ථ බෞද්ධ සමාගම විසින් ඉරුදින දහම් පාසැල්වල බුදුදහම ඉගැන්වීම නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ කරගෙන එන ලදී." දහම් පාසල් ආචාර්යවරුන්ගේ අත් පොත, (කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව,1974) 03 පිටුව.
8. ඕල්කට් සිහිවටන1880-1980, (ගාල්ල : ආරියදස මුද්‍රණාලය, 1980) 20 පිටුව.
9. දහම් පාසල් පරීක්ෂක සභාවේ වාර්තාව, (කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, 1958) 7 පිටුව.
10. එම.
11. මුද්‍රණය නොකළ කොළඹ තරුණ බෞද්ධ සංගමයේ ධර්ම පරීක්ෂණ අංශයේ වාර්තා.
11. එම.
12. දිනමිණ, 1942.04, 33 කාණ්ඩය පිටුව 01.
13. ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභාවේ වාර්තාව1943 නොවැ: (කොළඹ : රජයේ මුද්‍රණාලය, 1962) පිටුව 41.
14. 1927 පමණ වන විට 28000 පමණ දහම් පොත් මුද්‍රණය කිරීමට සංගමයට හැකියාව තිබුණි. *The Buddhist*, Sep. 1927, vol. 1, P.12.
15. *The Buddhist*, Feb. 1928, vol. 1, P.95.
16. දහම් පාසල් පුවත, 1 කාණ්ඩය, 1 කලාපය, (කොළඹ : කොළඹ තරුණ බෞද්ධ සංගමය, 1948) පිටුව 01.
17. *Ceylon Year Book*, (Colombo: Government Press, 1959) P. 214.
18. දහම් පාසැල් පරීක්ෂණ සභාවේ වාර්තාව; ලේකම් ප්‍රකාශය, (කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, 1958) පිටුව 03.



19. එම.
20. එම.
21. ධර්ම පරීක්ෂණ ආරම්භ කරන ලද්දේ 1920 වර්ෂයේදීය. එම වර්ෂයේදී දහම් පාසැල් 27කින් අපේක්ෂයෝ 374 පරීක්ෂණය සඳහා ඉදිරිපත් වූහ. එතැන් පටන් ආගමික පරීක්ෂණ අංශයේ වැඩ කටයුතු ශීඝ්‍රයෙන් පුළුල් වෙමින් පැවත ආවේය.Yong *Men's Buddhist Association, Report of the Board of Management for the Year 1964-65,* (Borella: YMBA Press, 1965) P.2.
22. බෞද්ධ ශිෂ්‍ය විභාගය සහ බෞද්ධාචාර්ය විභාගය, (බොරැල්ල: කොළඹ තරුණ බෞද්ධ සංගමය, ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය, 1937) 09 පිටුව.
23. එම.
24. එම.
25. දහම් පරීක්ෂණ සභාවේ වාර්තාව, (කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය,1958)පිටු 18-21.
26. සං අ /1186 අංකය හා 1970, 08, 26/ දරණ චක්‍රලේඛය.
27. බෞ.ක.පි.දෙ, බෞ/කො/සං/3/14 අංකය හා 1981. 09. 30 දින දරන චක්‍රලේඛය.
28. *Yong Men's Buddhist Association, Report of the Board of Management for the Year, 1970-1971*, (Borella: YMBA Press, 1965) P. 07.
29. Ibid, *YMBA Report*, 1964-65, P.2.
30. එම, 2 පිටුව.
31. "Over these years we have built up an organization which has deservedly won the confidence of the Buddhist public. The work of setting papers, marking script and supervising at the centers is done by a vast army of voluntary workers, *bhikkhus* and laymen who gladly devote their time to this task," Ibid, *YMBA Report*, 1970-71 P.02.
32. *Ceylon Year Book*, (Colomb: Government Press, 1959) P.215.
33. Ibid, P.240.
34. සං.ක.පි. දෙපාර්. අ/3/6-73 අංක සහ 1973.08.20 දින දරණ චක්‍රලේඛය.
35. C, Kariwasam, *Introduction of Moral Education for Sri Lankan School age Children*, Thesis (MA), University of Sri Lanka, Vidyodaya Campus (unpublished ), 1976, P.12.
36. "ආගමික අධ්‍යාපනයෙන් ආගමික ඥානයට අමතරව ලද හැකි ඉගෙනුම් ඵල කෙරෙහිද අධ්‍යාපන තත්ත්වය උස්ස කිරීම සඳහා ඉරුදින දහම් පාසැල් ආදි ආයතන සමඟ පාඨශාලා පැවැත්විය හැකි සහයෝගිතාව කෙරෙහි අවධානය යොමු කරන ලෙස.. "අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා, (කොළඹ: අධ්‍යාපන අමාත්‍යාංශය, 1982)03 පිටුව.
37. දහම් පාසැල් ගුරු අත්පොත, (කොළඹ: කො.ත.බෞ.ස, ලේක් හවුස්, 1981) පෙරවදන.
38. දහම් පාසැල් පරීක්ෂණ සභාවේ වාර්තාව, (කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, 1958) 13 පිටුව.
39. සමාජ සේවා අධ්‍යක්ෂකගේ පරිපාලන වාර්තාව, 1953, 99-100 පිටු.
40. බෞද්ධ තොරතුරු පරීක්ෂණ සභාවේ වාර්තාව, (බලංගොඩ : ධර්මවිජය මුද්‍රණාලය, 1956) 74 පිටුව.
41. "මිත්‍රත්වය, වාණිජ්‍ය සහ ආගම", එම, 29 පිටුව.
42. PEPieris, *Ceylon and the Portuguese*, 1505-1658, (Ceylon: American Ceylon Mission Press, 1920) P.58.
43. රංජිත් රුබේරු, ලංකාවේ අධ්‍යාපන පරිණාමය, (කොළඹ: එම්.ඩී ගුණසේන සහ සමාගම, 1964) 34 පිටුව.